# දියමන්ති ව්‍යාපෘතිය

## පුරවැසි අධ්‍යාපනය - 8 ශ්‍රේණිය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියෙහි අදහස, ඉලක්ක හා ක්‍රියාවලිය

'' නිපුණතා පාදක අධ්‍යාපනික ප්‍රවේශය" තුළින් වත්මන් ශ්‍රී ලාංකේය දරු පරපුර තුළ අර්ථවත් ඉගෙනුමක් මත පරිපූර්ණ ජීවිතයකට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, හුරුපුරුදු රෝපණය කොට ඒවා වර්ධනය කර ගැනීමට මඟපෙන්වීම් සිදු කර ඇත. පාසල් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ අපේක්ෂාව වනුයේ සක්‍රීය මෙන්ම ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් තුළ අත්දැකීම් ලබා ගැනීමට මඟපෙන්වීමත් ඒ මඟින් නිපුණතා පූර්ණ සමබර පෞරුෂයක් ඇති පුද්ගලයෙකු සමාජයට හිමිකර දීමත්ය. එහි අවසන් ඵලය වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයට යොදවන යෙදවුම් ප්‍රමාණයට සාපේක්ෂව, ඵලදායි නිමැවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන්, ගෝලීය ප්‍රවණතාවයට සරිලන පරපුරක් බිහි කිරීමත්ය.

එබැවින් සෑම පාසලක ම, සෑම ගුරුභවතෙකු විසින්  ම සෑම දරුවෙකුට ම සමාන ඉලක්ක සහිතව ඉගැන්වීම, පාඩම් සැලසුම් කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරීව නිරත කරවීම, පන්ති කාමර ඇගයීම් හා තක්සේරුකරණය ඵලදායී ලෙෂ යොදා ගැනීම හා කාලය සඵලදායි ලෙෂ කලමනාකරණය කර ගැනීමට අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් ''දියමන්ති ව්‍යාපෘතිය" හඳුන්වා දී ඇත.

සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් හා ගුණාත්මක යෙදවුම් තෝරා ගැනීමට ගුරුභවතුන්ට අත්‍යවශ්‍ය මඟපෙන්වීම පමණක් මෙමගින් ලබා දී තිබේ. ගුරුවරයා තම නිර්මාණාත්මක හැකියාව මත විධිමත්ව ඉලක්ක වෙත ළඟාවිය යුතුය. මෙමගින් නව ලොවට උචිත නිපුණතා පූර්ණ පුරවැසියන් බිහි කිරීම හා එයට ගැලපෙන ගුරු භූමිකාවක් හා ක්‍රියාශීලී පන්ති කාමරයක් සහිත ඉගෙනුම් සංස්කෘතියක් නිදහස් අධ්‍යාපනයට දායාද කිරීම අපගේ අපේක්ෂාවයි.

එස්. කුරුප්පු ආරච්චි
සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

# දියමන්ති ව්‍යාපෘතියෙහි ප්‍රයෝජන

❖ **මෙම ලේඛන භාවිතා කොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියළුම කණ්ඩායම් මතු සඳහන් උපදෙස් පරිදි කටයුතු කර දරුවන්ට ඉගෙනුම් අවස්ථා වැඩි වශයෙන් ලබා දීමට ක්‍රියා කළ යුතුය.**

1. ගුරුභවතුන් විසින් සෑම ඒකකයක්ම නියමිත කාල වකවානු තුළ නිම කිරීම.
2. ඊට අදාල ඉලක්ක, පැවරුම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ඇගයීම් ලබා දීම.
3. මෙම ඉලක්ක පිළිබඳව දරුවන්, දෙමව්පියන් ආදී සියලුම පාර්ශව දැනුවත් කිරීම. ( ටියුෂන් ගුරුවරු ද මෙම ඉලක්ක අනුගමනය කිරීම ඵලදායි වේ.)
4. පළාතේ සියලුම ඇගයීම් හා වාර පරීක්ෂණ මෙම ඉලක්ක මත ප්‍රමිතිගතව නිර්මාණය කිරීම.
5. විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, අංශ ප්‍රධාන, විෂය ප්‍රධාන යන අභ්‍යන්තර අධීක්ෂණ කණ්ඩායම් ද, ගුරු උපදේශක, විෂය අධ්‍යක්ෂවරු ආදී සියළුම බාහිර අධීක්ෂක කණ්ඩායම් ද මෙම ඉලක්ක අනුව කටයුතු කිරීම.
6. සියලුම අධීක්ෂණ වර්තා මඟින් මෙම ඉලක්ක ළඟාකර ගෙන ඇති ප්‍රමාණය සහ එහි ගුණාත්මක තත්ත්වයන් තක්සේරු කිරීම.
7. ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය සාධනය මැනීමේ දී මෙම ඇගයීම් වාර්තා මත කටයුතු කිරීම.

❖ තම විෂයයට අදාල කාලය කළමනාකරණය කර ගැනීම සඳහා ගුරුවරයාට ද, විෂයයකට අදාලව උපරිම ඉගෙනුම් කාලයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට ද අධීක්ෂණය හා නියාමනය සඳහා අභ්‍යන්තරව හා බාහිර අධීක්ෂකවරයාට ද, පාසල තුළ විෂය මාලාව නිසි ලෙස කළමනාකරණය පිණිස විදුහලිපතිවරයාට ද, ඇගයීම් ප්‍රමිතිගතව සංවිධානය සඳහා අදාල කණ්ඩායම් වලට ද, දරුවා යන ගමන් මඟ සහ පාසලේ ක්‍රියාවලිය නිසි ලෙස දැකීම දෙමව්පියන්ට ද, පාසලට හා දරුවාට සහාය දීම පිණිස විවිධ බාහිර පාර්ශවයන්ට ද, කළමනාකරණ තීරණ ගැනීම සඳහා කළමනාකරුවන් හා පරිපාලකයන්ට ද මූල්‍ය ප්‍රගතිය හා ඵලය මැනීම සඳහා විගණන නිලධාරයාට මෙම ලේඛනය අතිශය ඵලදායී වේ.

# සමාජයීය විද්‍යා විෂයන් දියමන්ති ව්‍යාපෘතියට . . .

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පළාතට අයිති ග්‍රාමීය නාගරික, ලොකු කුඩා, ජනප්‍රිය හා ජනප්‍රිය නොවන සෑම පාසලක් තුළම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියත්, අභ්‍යන්තර/ බාහිර අධීක්ෂණ ක්‍රියාවලියත්, සම්භවන/සම්පින්ඩිත ඇගයීම් ක්‍රියාවලියත්, නිෂ්චිත දින වකවානු, නිෂ්චිත ක්‍රමවේද හා නිෂ්චිත ප්‍රමිති සහිත ව ක්‍රියාත්මක කිරීම මගින් සෑම දරුවකු සඳහා ම සමාන ඉගෙනුම් අවස්ථා සම්පාදනයත්, අධ්‍යාපනයේ සම අවස්ථා සම්පාදනයත් ඉලක්ක කොටගෙන දියමන්ති ව්‍යාපෘති වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මේ අනුව පළාතේ සමාජ විද්‍යා ගුරු උපදේශකවරුන්ගේත්, විෂය ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ ගුරුභවතුන්ගේත් සම්පත්දායකත්වය ලබා ගෙන සකස් කරනු ලැබූ ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය විෂයයන්ට අයත් අධ්‍යයන ඉලක්ක, ආදර්ශ ඇගයීම් ආකෘති, ආදර්ශ ඉගෙනුම් ආධාරක ආදිය අනුගමනය කිරීම, සැලසුම් සහගත අධ්‍යයන ක්‍රියාවලියකට මග පාදයි. තවද ගුරුවරයාගේ කාලය මනා ලෙස කළමනාකරණයට මග පාදයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සෘණාත්මකව බලපෑමක් කරන, පාඩමට පූර්ව සූදානම සම්බන්ධව ඇතැම් ගුරුවරුන්ගේ තිබෙන ගැටළුත්, ඒකාකාරී ඉගෙනුම් ක්‍රමවේදයන් හේතුවෙන් බහුවිධ හැකියාවන්ගෙන් යුත් දරුවන්ට සිදුවන අවාසිදායක තත්ත්වයනුත් මෙතුළින් නිවැරදි කරගත හැකිය.

මෙහි දී විශේෂයෙන් ම අවධාරණය කළ යුතු කාරණාවක් වන්නේ දියමන්ති ව්‍යාපෘතිය දෙවන අදියර කොටසේ දී අප විසින් ඉදිරිපත් කරන ආකෘතිය ගුරුවරයාට කරන මග පෙන්වීමක් පමණක් වන අතර විෂය උගන්වන ගුරුවරයාගේ දැනුම අත්දැකීම් හා හැකියාවන් මත මෙම මගපෙන්වීම ඔස්සේ විෂය මාලාව නිර්මාණශීලීව සකස් කර ගත හැකිය. ආකෘතියකින් අප ඉදිරිපත් කරන ආදර්ශ ක්‍රමවේදයන්ට සීමා වීම අපේක්ෂා නොකෙරේ. සමාජීයය විද්‍යා විෂයයන්ට අදාළ ගුරු මාර්ගෝපදේශ සහ අනෙකුත් සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණශිලී ඉගෙනුම් අත්දැකීමක් වෙත සිසුන් යොමු කිරීමෙන් මෙහි ඇති ඉලක්ක වෙත වඩාත් සඵලදායි ලෙස ළඟාවීම ගුරුවරයා සතු වගකීම වේ.

ඒ අනුව මෙහි සඳහන් දින වකවානු අනුව ම, පාඩම් ඒකක අවසන් කර අදාළ ඇගයීම්වලට සිසුන් යොමු කිරීම අපේක්ෂා කරන අතර මෙය අප පළාතේ දරුවන් සමබර පෞරුෂයකින් යුක්ත ව සමාජයට දායාද කිරීමට ඔබ දක්වන මාහැඟි දායකත්වයට අත්වැලක් වනු ඇත.

ජේ. ඒ. ඩී. මාලින්ද
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යාව)
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.

## (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**8 ශ්‍රේණිය**

**පළමු වාරය - පුරවැසි අධ්‍යාපනය**

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **08** | 8.1 පොදු සේවා | 8.1.1 පොදු සේවා<br>• හැඳින්වීම | පෙබරවාරි 02 | 02 | පැය 01 වි. 20 | |
| | | • අවශ්‍යතාව හා විකාශනය | | | | |
| | | • කාලීන වැදගත්කම | | | | |
| | | • පොදු සේවා වල ලක්ෂණ | | | | |
| | | 8.1.2 පොදු සේවා සපයන ආයතන | පෙබරවාරි 02 | 03 | පැය 02 | |
| | | 8.1.3 පොදු සේවා සපයන ආයතන හා බැඳුනු වගකීම් හා යුතුකම්. | පෙබරවාරි 02 | 02 | පැය 01 වි. 20 | |
| | 8.2 ප්‍රජාතන්වාදී ජන සමාජය | 8.2.1 තම පවුල හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ | මාර්තු 16 | 01 | වි. 40 | |
| | | 8.2.2 ළමා අයිතිවාසිකම් හා යුතුකම් | මාර්තු 16 | 03 | පැය 02 | |
| | | 8.2.3 චිත්ත වේග හසුරුවා ගැනීම | මාර්තු 16 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.2.4 නායකත්ව ගුණාංග | මාර්තු 16 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.2.5 ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අවශ්‍ය ගුණාංග | මාර්තු 16 | 02 | පැය 01 වි. 20 | |

## දෙවන වාරය

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | 8.3 බහු සංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ | 8.3.1 බහු සංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ | ජූනි 01 | 03 | පැය 02 | |
| | | 8.3.2 සංස්කෘතික විවිධත්වය | ජූනි 01 | 03 | පැය 02 | |
| | | 8.3.3 ගැටුම් අවම කිරීම | ජූනි 01 | 04 | පැය 02 වි. 40 | |
| | 8.4 කාලීන ගැටළු | 8.4.1 අනතුරු හා විපත් | ජූනි 13 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.4.2 අනතුරු අවස්ථාවකදී කටයුතු කළයුතු ආකාරය | ජූනි 13 | 01 | වි. 40 | |
| | | 8.4.3 අනතුරු හා විපත් සිදුවිය හැකි ස්ථාන හා ආපදා කළමනාකරණය | ජූනි 13 | 01 | වි. 40 | |
| | | 8.4.4 මාර්ග අනතුරු | ජූනි 13 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.4.5 රසායනික ද්‍රව්‍ය හා විනය හා එමඟින් වන අනතුරු | ජූනි 13 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.4.6 තිරසාර සංවර්ධනය | ජූනි 13 | 02 | පැය 01 වි. 20 | |

## තුන්වන වාරය

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | 8.5 ගැටළු විසඳමින් අභියෝග ජය ගනිමු | 8.5.1 එදිනෙදා ජීවිතයේදී මුහුණ පෑමට සිදුවන විවිධ ගැටළු හා අභියෝග | ඔක්තෝම්බර් 12 | 03 | පැය 02 | |
| | | 8.5.2 ජීවිතයේ විවිධ ගැටළු හා අභියෝගවලට සාර්ථකව මුහුණදීම. | ඔක්තෝම්බර් 12 | 03 | පැය 02 | |
| | 8.6 වැඩ ලෝකයට පිවිසෙමු | 8.6.1 වැඩ ලෝකයේ විවිධත්වය | නොවැම්බර් 14 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.6.2 ශ්‍රම අභිමානයෙන් යුතුව කටයුතු කිරීම | නොවැම්බර් 14 | 01 | වි. 40 | |

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | | 8.6.3 සෑම රැකියාවක්ම සමාජයේ ප්‍රගමනයට හේතු වන ආකාරය | නොවැම්බර් 14 | 01 | වි. 40 | |
| | | 8.6.4 පුහුණු ශ්‍රමයේ වැදගත්කම | නොවැම්බර් 14 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.6.5 යහපත් ශ්‍රමිකයකුගේ ගුණාංග | නොවැම්බර් 14 | 01 | වි. 40 | |
| | | 8.6.6 සේවා ස්ථානයක අපේක්ෂා | නොවැම්බර් 14 | 01 | වි. 40 | |
| | | 8.6.7 සේවක අයිතිවාසිකම් හා වගකීම් | නොවැම්බර් 14 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.6.8 පෞද්ගලික වෘත්තීය ගුණාංග ප්‍රගුණ කර ගැනීමේ වැදගත්කම | නොවැම්බර් 14 | 02 | පැය 01 වි. 20 | |
| | | 8.6.9 සේවා ලාභීන් තෘප්තිමත් කළහැකි විවිධ උපාය මාර්ග | නොවැම්බර් 14 | 01 | වි. 40 | |
| | | 8.6.10 ආදායම් ඉපයීම ජීවන රටාවට බලපාන ආකාරය | නොවැම්බර් 14 | 01 | වි. 40 | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.

## (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**8 ශ්‍රේණිය**

**පළමු වාරය - පුරවැසි අධ්‍යාපනය**

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.1.1 පොදු සේවා<br>• හැඳින්වීම<br>• අවශ්‍යතාව හා විකාශනය<br>• කාලීන වැදගත්කම<br>• පොදු සේවා වල ලක්ෂණ | පොදු සේවා සපයන ආයතනයක් තෝරා ගෙන ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. එම ආයතනයේ වැදගත්කම, පරිහරණයේදී මහජනතාවගේ නොසැලකිලිමත් බව හා අපරීක්ෂාකාරී බව නිසා සිදුවී ඇති ගැටළු හා පාඩු හඳුනා ගැනීම. | පොදු සේවා සපයන ආයතනයක් තෝරා ගෙන එම ආයතනය මඟින් සාමාන්‍ය මහජනතාවට සිදුවන සේවය පැහැදිලි කරමින් රූපවාහිනි වැඩ සටහනක් මෙහෙය වීම. | සාකච්ඡා ක්‍රමය<br>පැවරුම් ක්‍රමය<br>විවාද ක්‍රමය<br>ප්‍රශ්නකරණය<br>භූමිකා රංගන | පොදු සේවා සපයන ආයතන පිළිබඳ වීඩියෝ දර්ශන<br>අදාළ චිත්‍ර<br>අදාළ පින්තූර<br>අදාළ ගීත | ගුවන් විදුලි වැඩ සටහන්වලට සවන්දීම, රූපවාහිනී වැඩසටහන්, පුවත්පත්, සඟරා අදාළ පරිදි නැරඹීම හා කියවීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.1.2 පොදු සේවා සපයන ආයතන | පොදු සේවා සපයන රජයේ ආයතන නම් කරයි.<br>• එම ආයතනවල කාර්යභාරය පැහැදිලි කිරීම<br>• පොදු සේවා සපයන වෙනත් ආයතන හඳුනා ගනියි. | පොදු සේවා සපයන ආයතන නම් කර ඒවායේ කාර්‍යභාරය පිළිබඳ පාසැල් සමාජ විද්‍යා සංගමයට සාරවත් කතාවක් ඉදිරිපත් කරයි. | සාකච්ඡා ක්‍රමය<br>පැවරුම් ක්‍රමය<br>විවාද ක්‍රමය<br>ප්‍රශ්නකරණය<br>භූමිකා රංගන | පොදු සේවා සපයන ආයතන පිළිබඳ වීඩියෝ දර්ශන<br>අදාළ චිත්‍ර<br>අදාළ පින්තූර<br>අදාළ ගීත | ගුවන් විදුලි වැඩ සටහන්වලට සවන්දීම, රූපවාහිනී වැඩසටහන්, පුවත්පත්, සඟරා අදාළ පරිදි නැරඹීම හා කියවීම. | |
| 8.1.3 පොදු සේවා සපයන ආයතන හා බැඳුනු වගකීම් හා යුතුකම්. | එම ආයතන හා බැඳුනු යුතුකම් හා වගකීම් ලැයිස්තු ගත කරයි. | පොදු ආයතන හා බැඳුණු වගකීම් හා යුතුකම් දැක්වෙන පෝස්ටරයක් නිර්මාණය කිරීම. | භූමිකා රංගන<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>පැවරුම්<br>විවාද<br>ප්‍රශ්නකරණය | පොදු සේවා සපයන ආයතන පිළිබඳ වීඩියෝ දර්ශන<br>අදාළ චිත්‍ර<br>අදාළ පින්තූර<br>අදාළ ගීත | පොදු සේවා සපයන ආයතන වලට හැනි සිදුකරන පුද්ගලයකු දුටුවිට ඔබ එය නිවැරදි කරවන ආකාරය දැක්වෙන දෙබසක් ලියා දක්වන්න. | |
| 8.2.1 තම පවුල හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ | පවුල හා පාසල තුළ ක්‍රියාත්මක ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ නම් කරයි. සමාජය තුළ ජීවත් වීමේදී ප්‍රජාතන්ත්‍රවාදි ගුණාංග ප්‍රගුණ කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | පවුල හා පාසල තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ නිරූපණය කරන භූමිකා රංගනයක් නිර්මාණය කරයි. | ගුවන්විදුලි වැඩසටහනකට සවන්දීම.<br>රූපවාහිනි හෝ වීඩියෝ දර්ශන නැරඹීම.<br>සාකච්ඡා ක්‍රමය<br>විවාද ක්‍රමය,<br>පැවරුම් ක්‍රමය | අදාළ වීඩියෝ දර්ශන, චිත්‍ර, පෝස්ටර්, ගීත | පාර්ලිමේන්තුවේ සැසිවාරයක් නැරඹීමට යාම.<br>පැරණි සමාජ ක්‍රමවල පැවති ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ සොයා බලා පාසලේ බිත්ති පුවත්පතට ලිපියක් ලිවීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.2.2 ළමා අයිතිවාසිකම් හා යුතුකම් | ළමා අයිතිවාසිකම් මොනවාදැයි පෙළගස්වයි.<br>• ඒවා හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමෙන් සමාජයට අත්වන ප්‍රයෝජන දැක්වෙන සාරවත් කතාවක් උදෑසන රැස්වීමේදී ඉදිරිපත් කරයි. | පැවරුම් ක්‍රමය ප්‍රශ්නකරණය විවාද ක්‍රමය භූමිකා රංගන | අදාළ චිත්‍රපට, නාට්‍ය, චිත්‍ර, පෝස්ටර් | ළමා අයිතිවාසිකම් සුරැකීමේ වැදගත්කම දැක්වෙන චිත්‍රපට, නාට්‍ය තෝරාගෙන නැරඹීම. | |
| 8.2.3 චිත්ත වේග හසුරුවා ගැනීම | යහපත් හා අයහපත් චිත්තවේග මොනවාදැයි වෙන්කර හඳුනා ගනියි. | යහපත් හා අයහපත් චිත්තවේග ඇතිකර ගැනීමෙන් සමාජයට සිදුවන යහපත පිළිබඳ දැක්වෙන නාට්‍යයක් සමාජ විද්‍යා ශිෂ්‍ය සමිතියේදී රඟ දැක්වීම. | නාට්‍ය සාකච්ඡා ක්‍රමය පැවරුම් ක්‍රමය විවාද ක්‍රමය ප්‍රශ්නකරණය | වීඩියෝ පට පුවත්පත් චිත්‍ර | යහපත් හා අයහපත් චිත්තවේග හඳුනා ගැනීම සඳහා අභිරූපනයක් ඉදිරිපත් කිරීම. | |
| 8.2.4 නායකත්ව ගුණාංග | නායකත්ව ගුණාංග හඳුනා ගනිමින් නායකත්වය හා අනුගාමිකත්වය අතර වෙනස පැහැදිලි කරයි. | විශිෂ්ට නායකත්ව ගුණාංග ප්‍රගුණ කර දෙස් විදෙස් හා ආගමික නායකයින් නම් | පැවරුම් ක්‍රමය | පොත්පත් වීඩියෝ පට පුවත් පත් වාර්තා | ඔබ කැමති නායකත්ව ලක්ෂණ වලින් පෝෂිත පුද්ගලයකු පිළිබඳ කතාවක් පන්තියට ඉදිරිපත් කරන්න. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.2.5 ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අවශ්‍ය ගුණාංග | ප්‍රජාතන්ත්‍රවාදි ජීවන රටාව සමාජයේ යහපැවැත්මට හේතුවන ආකාරය විස්තර කරයි. | සමාජයේ ගැටුම් බහුල වීමට හේතුව ප්‍රජාතන්ත්‍රවාදී බවින් මිනිසුන් ඈත්වීම යන මැයෙන් රචනයක් බිත්ති පුවත්පතකට ඉදිරිපත් කරයි. | පැවරුම් ක්‍රමය<br>විවාද ක්‍රමය<br>නිරීක්ෂණ<br>සාකච්ඡා ක්‍රමය | පොත්පත්<br>වීඩියෝ පට<br>පුවත් පත්<br>වාර්තා | සමාජය ප්‍රජාතන්ත්‍රවාදි බවින් ඈත්වීම නිසා මතු වී ඇති ගැටළු අවම කිරීම සඳහා විද්වත් මණ්ඩල කතිකාවක් සංවිධානය කිරීම. | |
| 8.3.1 බහු සංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ | බහු සංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ පැහැදිලිව නම් කරයි. | බහු සංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ නිරූපණය වන චිත්‍රයක් නිර්මාණය කරයි. | පැවරුම් ක්‍රමය<br>විවාද ක්‍රමය<br>නිරීක්ෂණ<br>සාකච්ඡා ක්‍රමය | පොත්පත්<br>වීඩියෝ පට<br>පුවත් පත්<br>වාර්තා | ඔබ ප්‍රදේශයේ පැවැත්වෙන වෙනත් ආගමික උත්සවයක් නැරඹීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. | |
| 8.3.2 සංස්කෘතික විවිධත්වය 8.3.3 ගැටුම් අවම කිරීම | ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය හා බැඳුණු උත්සව, සිරිත් විරිත් පිළිබඳ තොරතුරු රැස් කරයි. | ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම පිළිබඳ තොරතුරු රැස්කර කුඩා පොත් පිංචක් නිර්මාණය කරයි. | භූමිකා රංගන<br>පැවරුම්<br>විවාද<br>නිරීක්ෂණ | පොත්පත්<br>වීඩියෝ පට<br>පුවත් පත්<br>වාර්තා | ශ්‍රී ලංකාවේ ජනවර්ග හා බැඳුණු සිරිත් විරිත් සොයාබලා කුඩා පොත් පිංචක් නිර්මාණය කරයි. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.4.1 අනතුරු හා විපත් | • ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතු කොටගෙන සිදුවන අනතුරු හා විපත් හඳුනා ගෙන නම් කරයි.<br>• අනතුරු වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග වගු ගත කරයි. | අනතුරු හා ආපදාවලදී සහය වන ආයතන නම්කර ඒවා මඟින් සපයා ඇති උපදෙස් පිළිපැදීමේ වැදගත්කම හුවා දක්වමින් ගුවන් විදුලි සාකච්ඡාවක් මෙහෙයවයි. | විවාද සාකච්ඡා සම්මන්ත්‍රණ | පොත්පත් වීඩියෝ පට පුවත් පත් වාර්තා | ආපදා අවම කරගැනීමෙන් අත්වන ප්‍රයෝජන විස්තර කරමින් පාසලේ විද්‍යා සංගමයේ සඟරාවට ලිපියක් ලිවීම. | |
| 8.4.2 අනතුරු අවස්ථාවකදී කටයුතු කළයුතු ආකාරය | අනතුරකදී කටයුතු කළයුතු ආකාරය දක්වෙන පෙරහුරුවක් පැවැත්වීම. | අනතුකදී ප්‍රථමාධාර සපයන ආකාරය දක්වෙන භූමිකා රංගනයක් නිරූපණය කිරීම. | පැවරුම් ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය ක්ෂේත්‍ර චාරිකා ප්‍රශ්නකරණය | වීඩියෝ පට රූපවාහිනී වැඩසටහන් පුවත්පත් වාර්තා පොත්පත්, වාර්තා | ප්‍රථමාධාර පිළිබඳ මනා අවබෝධයක් ඇති නිලධාරියකු ගෙන්වා ඒ පිළිබඳව පාසලේ වැඩමුළුවක් පැවැත්වීම. | |
| 8.4.3 අනතුරු හා විපත් සිදුවිය හැකි ස්ථාන හා ආපදා කළමනාකරණය | අනතුරු හා විපත් සිදුවිය හැකි ස්ථාන නම් කරයි. වෙනත් අනතුරු නම් කරයි. | මත්පැන් පානය කර රිය පැදවීමෙන් සිදුවන අනතුරු වැඩිවීමට හේතු දක්වමින් පුවත් පතකට ලිපියක් ලියයි. | පැවරුම් ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය ක්ෂේත්‍ර චාරිකා ප්‍රශ්නකරණය | වීඩියෝ පට රූපවාහිනී වැඩසටහන් පුවත්පත් වාර්තා පොත්පත්, වාර්තා | ආපදා කළමනාකරණය කරන අයුරු දක්වෙන සම්මන්ත්‍රණයක් ආපදා කළමනාකරණ අමාත්‍යංශයේ සහය ඇතිව පැවැත්වීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.4.4 මාර්ග අනතුරු | මාර්ග අනතුරු වලට හේතු ලැයිස්තුගත කරයි. ඒවා වලක්වා ගැනීමෙන් අත්වන ආර්ථිකමය වාසි විස්තර කරයි. | මාර්ග අනතුරකදී කටයුතු කළයුතු ආකාරය දක්වෙන පෙරහුරුවක් පැවැත්වීම. | පැවරුම් ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය ක්ෂේත්‍ර චාරිකා ප්‍රශ්නකරණය | වීඩියෝ පට රූපවාහිනී වැඩසටහන් පුවත්පත් වාර්තා පොත්පත්, වාර්තා | මාර්ග අනතුරකදී කටයුතු කළයුතු ආකාරය දක්වෙන පෝස්ටරයක් නිර්මාණය කිරීම. | |
| 8.4.5 රසායනික ද්‍රව්‍ය හා විනය හා එමඟින් වන අනතුරු | අනතුරකදී ගතයුතු ක්‍රියාමාර්ග හා ඒවා වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග විස්තර කරයි. | රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත අනතුරු වලක්වා ගතහැකි ආකාරය පිළිබඳව අදාළ නිලධාරියකු මඟින් සාකච්ඡාවක් පැවැත්වීම. | පැවරුම් ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය ක්ෂේත්‍ර චාරිකා ප්‍රශ්නකරණය | වීඩියෝ පට රූපවාහිනී වැඩසටහන් පුවත්පත් වාර්තා පොත්පත්, වාර්තා | රසායන ද්‍රව්‍ය භාවිතයේදී සැලකිලිමත් වියයුතු කරුණු දක්වෙන ලේඛනයක් සකස් කර ප්‍රදර්ශනය කිරීම. | |
| 8.4.6 තිරසාර සංවර්ධනය | දිරිය හැකි ජීවන රටාවකට හුරුවිය හැකි ආකාරය විස්තර කරමින් සාරවත් කතාවක් උදෑසන රැස්වීම සඳහා ඉදිරිපත් කිරීම | ආහාර හා ඇඳුම් පැළඳුම් සඳහා දිරිය හැකි පරිසර ජන රටාවකට හුරු අයුරු දක්වීමට භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීම. | පැවරුම් ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය ක්ෂේත්‍ර චාරිකා ප්‍රශ්නකරණය | වීඩියෝ පට රූපවාහිනී වැඩසටහන් පුවත්පත් වාර්තා පොත්පත්, වාර්තා | තිරසාර සංවර්ධනයට දායක විය හැකි අයුරු දක්වෙන චිත්‍රයක් නිර්මාණය කිරීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.5.1 එදිනෙදා ජීවිතයේදී මුහුණ පෑමට සිදුවන විවිධ ගැටළු හා අභියෝග | • සාමාන්‍ය ජීවිතයේදී ඔබට මුහුණ පෑමට සිදුවන විවිධ අභියෝග මොනවාදැයි පෙළගැස්වීම.<br>• එවැනි අභියෝග වලදී අප විසින් ක්‍රියාත්මක විය යුතු ආකාරය විමර්ශනය කිරීම. | ඔබට එදිනෙදා ජීවිතයේදී මුහුණ පෑමට සිදුවන විවිධ අභියෝග දක්වෙන භූමිකා රංගන,<br>• ආගමික නායකයකු මඟින් අභියෝග ජය ගැනීමට ආගමික වශයෙන් ලබා දෙන සහය දක්වමින් දේශණයක් පැවැත්වීම. | භූමිකා රංගන සාකච්ඡා ක්‍රමය පැවරුම් ක්‍රමය කණ්ඩායම් ක්‍රියාකාරකම් | පොත්පත් රූපවාහිනී වැඩසටහන් වීඩියෝ පට පුවත්පත් විශේෂ දේශන | සමාජයේ අභියෝග හමුවේ නොසැලී ජීවත් වන ආකාරය දක්වමින් විද්වත් සාකච්ඡා මණ්ඩපයක් සංවිධානය කිරීම. (සාහිත්‍ය සමිතිය මඟින්) | |
| 8.5.2 ජීවිතයේ විවිධ ගැටළු හා අභියෝගවලට සාර්ථකව මුහුණදීම. | ඕනෑම ගැටළුවකට විසඳුම් ඇති බවත් එම ගැටළු විසදා ගැනීමට අවශ්‍ය විකල්ප විසඳුම් හා උපදේශන සේවා ලබාදීම. | විවිධ ගැටළු හා අභියෝග නම්කර ඒවාට ගතහැකි විසඳුම් ලැයිස්තුගත කරන්න. | භූමිකා රංගන සාකච්ඡා ක්‍රමය පැවරුම් ක්‍රමය කණ්ඩායම් ක්‍රියාකාරකම් | පොත්පත් රූපවාහිනී වැඩසටහන් වීඩියෝ පට පුවත්පත් විශේෂ දේශන | විවිධ ගැටළු හා අභියෝග වලට මුහුණු දීමේ ශක්තිය ඇති කරලීම වස් මනෝවිද්‍යා උපදේශකවරයකුගේ දේශනයක් හා ප්‍රායෝගික වැඩමුළුවක් සංවිධානය කිරීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.6.1 වැඩ ලෝකයේ විවිධත්වය | වැඩ ලෝකයේ පවතින විවිධ රැකියා පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ නම් කරන්න.<br>• කාර්මික<br>• කෘෂිකාර්මික<br>• සේවා<br>ස්වයං රැකියා | වැඩ ලෝකයේ විවිධ රැකියාවල වැදගත්කම පෙන්වා දෙමින් ලෝක කම්කරු දිනයේදී දේශනයක් සංවිධානය කිරීම. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>භූමිකා රංගනය<br>නිරීක්ෂණ<br>පැවරුම් ක්‍රමය | පුවත්පත්<br>රූපවාහිනී<br>වැඩසටහන්<br>වීඩියෝ පට<br>චිත්‍ර | සේවාදායක හා සේවා යෝජක අතර අන්‍යෝන්‍ය බැඳීමෙන් කටයුතු කිරීමෙන් තම ආයතනය සංවර්ධනය කිරීමට හැකිවන බව දක්වෙන භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීම. | |
| 8.6.2 ශ්‍රම අභිමානයෙන් යුතුව කටයුතු කිරීම | ශ්‍රම අභිමානයෙන් යුතුව සේවයේ යෙදීමේ වැදගත් ආයතනයේ මෙන්ම තමාගේ දියුණුවට ද බලපාන ආකාරය විස්තර කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීම. | ශ්‍රම අභිමානයෙන් කටයුතු කිරීමෙන් සේවා යෝජකයාට සේවාදායකයාට හා සේවාලාභීන්ට අත්වන ප්‍රයෝජන ලැයිස්තු ගත කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>භූමිකා රංගනය<br>නිරීක්ෂණ<br>පැවරුම් ක්‍රමය | පුවත්පත්<br>රූපවාහිනී<br>වැඩසටහන්<br>වීඩියෝ පට<br>චිත්‍ර | වර්තමාන සමාජය යොමුව ඇති විවිධ ස්වයං රැකියා වර්ග නම් කර ඒවායින් එම පුද්ගලයින්ට හා සමාජයට ඇතිවී ඇති ප්‍රයෝජන සඳහන් කරමින් ලෝක කම්කරු දිනය නිමිත්තෙන් පුවත්පතකට ලිපියක් සකස් කරන්න. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.6.3 සෑම රැකියාවක්ම සමාජයේ ප්‍රගමනයට හේතු වන ආකාරය | පුද්ගල හැකියා අනුව රැකියා ලබාදිය යුතු බවත් එය සමාජ ප්‍රභවයට හේතුවන බවත් විස්තර කරමින් රැකියා සඳහා තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණයක් සංවිධානය කිරීම. | රැකියාවකදී සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන ආකාරය දැක්වෙන භූමිකා රංගනයක් නිර්මාණය කිරීම. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>භූමිකා රංගනය<br>නිරීක්ෂණ<br>පැවරුම් ක්‍රමය | පුවත්පත්<br>රූපවාහිනී වැඩසටහන්<br>වීඩියෝ පට<br>චිත්‍ර | වර්තමාන සමාජයේ සේවා වියුක්තිය ඉහළ යාමට බලපාන හේතු විස්තර කරමින් එයට විසඳුමක් ලෙස ස්වයං රැකියා සඳහා අනුබල ලබාදීම සුදුසු බව යෝජනා කරමින් එවන් රැකියා හඳුන්වා දීමට වැඩසටහනක් සංවිධානය කිරීම. | |
| 8.6.4 පුහුණු ශ්‍රමයේ වැදගත්කම | වෘත්තිය පුහුණුව ලබාදෙන රාජ්‍ය සහ පෞද්ගලික ආයතන නම් කරන්න. | දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලේ වැඩි වශයෙන් ඉල්ලුමක් ඇති රැකියා ලැයිස්තුවක් සකස් කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>භූමිකා රංගනය<br>නිරීක්ෂණ<br>පැවරුම් ක්‍රමය | පුවත්පත්<br>රූපවාහිනී වැඩසටහන්<br>වීඩියෝ පට<br>චිත්‍ර | පුහුණු ශ්‍රමිකයකුගේ සේවය ඇඟලුම් ක්ෂේත්‍රයට යොදා ගත හැකි ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා ඇඟලුම් කර්මාන්ත ශාලාවක ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.6.5 යහපත් ශ්‍රමිකයකුගේ ගුණාංග | යහපත් ශ්‍රමිකයකු සතු ගුණාංග විස්තර කරයි. | ආයතනයක සේවකයකු ලෙස කටයුතු කිරීමේදී ඔබ විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග විස්තර කරමින් ගුවන් විදුලි සාකච්ඡාවක් සංවිධානය කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>භූමිකා රංගනය<br>නිරීක්‍ෂණ<br>පැවරුම් ක්‍රමය | පුවත්පත්<br>රූපවාහිනී වැඩසටහන්<br>වීඩියෝ පට<br>චිත්‍ර | ආයතනයක් තෝරා ගෙන එහි කටයුතු කළයුතු ආකාරය දක්වෙන නීතිරීති මාලාවක් සංකස් කර ප්‍රදර්ශනය කරන්න. | |
| 8.6.6 සේවා ස්ථානයක අපේක්ෂා | සේවා ස්ථානයක අපේක්ෂා ලැයිස්තු ගත කරයි. | සේවා අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා සාමකාමීව අරගල කළයුතු ආකාරය දක්වෙන විද්වත් දේශනයක් සංවිධානය කිරීම. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>භූමිකා රංගනය<br>නිරීක්‍ෂණ<br>පැවරුම් ක්‍රමය | පුවත්පත්<br>රූපවාහිනී වැඩසටහන්<br>වීඩියෝ පට<br>චිත්‍ර | ඔබ ප්‍රදේශයේ රැකියා සඳහා යාමේදී නියමිත වේලාවට සේවා ස්ථානයට යාමට ඇති පොදු ප්‍රවාහන පද්ධතියේ පවතින අඩුපාඩු විස්තර කරමින් එය විධිමත් කරදෙන ලෙස ඉල්ලමින් ප්‍රවාහන අමාත්‍යවරයාට යැවීම සඳහා ලිපියක් සකස් කරන්න. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 8.6.7 සේවා අයිතිවාසිකම් හා වගකීම් | සේවක අයිතිවාසිකම් වගු ගත කරයි. | අයිතිවාසිකම් හා බැඳි යුතුකම් ඉටුකිරීමෙන් වැදගත්කම පැහැදිලි කරයි. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>භූමිකා රංගනය<br>නිරීක්ෂණ<br>පැවරුම් ක්‍රමය | පුවත්පත්<br>රූපවාහිනී<br>වැඩසටහන්<br>වීඩියෝ පට<br>චිත්‍ර | ආයතනයක ඔබ විසින් නිවාඩු ලබා ගැනීමේදී ඔබ විසින් සැලකිලිමත් වියයුතු කරුණු මොනවාදැයි පෙලගස්වන්න. | |
| 8.6.8 පෞද්ගලික වෘත්තිය ගුණාංග ප්‍රගුණ කර ගැනීමේ වැදගත්කම | පෞද්ගලික වෘත්තිය ගුණාංග ප්‍රගුණ කර ගැනීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග ලැයිස්තු ගත කරයි. | වෘත්තිය මාර්ගෝපදේශකයකු ලවා දේශනයක් සංවිධානය කිරීම. | සාකච්ඡා ක්‍රමය<br>පැවරුම් ක්‍රමය<br>ප්‍රයෝගික<br>සාකච්ඡා මණ්ඩල<br>ක්ෂේත්‍ර චාරිකා | වීඩියෝ දර්ශන<br>පුවත්පත් වාර්තා<br>පොත්පත් | නව තාක්ෂණික ක්‍රම ශිල්ප ඔස්සේ වෘත්තිය පුහුණුව ලබා ගැනීම සඳහා සිසුන් අනාගතයේද යොමු කිරීම සඳහා වෘත්තිය මාර්ගෝපදේශකයකු ලවා දේශනයක් පැවැත්වීම. | |
| 8.6.9 සේවා ලාභීන් තෘප්තිමත් කළහැකි විවිධ උපාය මාර්ග | වර්තමාන සමාජය තුළ අඩු වැටුපක් ලබාදීම නිසා සාමාන්‍ය ජනතාවට මුහුණ පෑමට වන ගැටළු ලැයිස්තු ගත කරයි. | සාධාරණ වැටුපක් ලබාදීමෙන් සේවාදායකයාට මෙන්ම සේවා යෝජකයාටද අත්වන වාසි මොනවාදැයි ලැයිස්තු ගත කරයි. | පැවරුම් ක්‍රමය<br>ප්‍රයෝගික<br>සාකච්ඡා මණ්ඩල<br>ක්ෂේත්‍ර චාරිකා | වීඩියෝ දර්ශන<br>පුවත්පත් වාර්තා<br>පොත්පත් | සේවාලාභීන් තෘප්තිමත් කිරීම සඳහා වාර්ෂිකව චාරිකාවක් සංවිධානය කරන්න. | |
| 8.6.10 ආදායම් ඉපයීම ජීවන රටාවට බලපාන ආකාරය | සමාජ හිතකාමී මාර්ග මගින් ආදායම් වැඩි කරගැනීමේ ක්‍රම ලැයිස්තු ගත කරයි | අධාර්මික මාර්ග තුලින් ධනය ඉපයීම මර්දනය කළ හැක්කේ නීතිය මගින්ද, ආගම දහම මගින්ද යන මැයෙන් විවාදයක් සංවිධානය කිරීම. | පැවරුම් ක්‍රමය<br>ප්‍රයෝගික<br>සාකච්ඡා මණ්ඩල<br>ක්ෂේත්‍ර චාරිකා | වීඩියෝ දර්ශන<br>පුවත්පත් වාර්තා<br>පොත්පත් | වර්තමානයේ බහුල වශයෙන් තරුණ පරපුර මත්ද්‍රව්‍ය ඇබ්බැහි වී ඇත. එය මැඩ පැවැත්වීමට හැකි ක්‍රියාමාර්ග යන මැයෙන් පොහෝදා රූපවාහිනි වැඩ සටහනක් සංවිධානය කිරීම. | |